Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**9 ශ්‍රේණිය**

# භූගෝල විද්‍යාව

**කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න**

01 ආසියාව අප්‍රිකාවෙන් වෙන්වන මායිමක් ලෙස ................................................ සැළකේ.

(රතු මුහුද / කහ මුහුද / බෝල්ටික් මුහුද)

02 වයඹ ගිණිකොන දිශානුගතව විහිදෙන ................................................ කඳු සමාන්තර හෙල්වැටියකට උදාහරණයකි.

(රිටිගල / සීගිරිය / රක්වාන)

03 කොකසොයිඩ් ජන වර්ගය ජීවත්වන රටක් ලෙස ................................................ හඳුනාගත හැකිය.

(කොරියාව / ඉන්දියාව / ජපානය)

04 ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය අනුව ලෝකයේ තුන්වන විශාලතම ආර්ථිකයකට හිමිකම් කියන රට ................................................ ලෙස සැළකේ.

(ඩුබායි / පාකිස්ථානය / ජපානය)

05 අසනි වැසි, අකුණු කුණාටු වැසි යනුවෙන්ද හැඳින්වෙන්නේ ................................................ වර්ෂාවයි.

(සංවහන / වාසුළි / මෝසම්)

- **අං 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 අක්ෂාංශ හා දේශාංශ හෙවත් භූගෝලීය ඛණ්ඩාංක උපයෝගී කරගෙන කිසියම් ස්ථානයක පිහිටීම දක්වීම නිරපේක්ෂ පිහිටීම වේ. (..........)

07 ලෝකයේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශයක් ලෙස සැළකෙන චෙරාපුංචි ප්‍රදේශය ජපානයේ පිහිටියේය. (..........)

08 වියළි කලාපයේ රැළි බිම් වලින් ආරම්භ වී වර්ෂා කාලයේදී ගලායන වියළි කාලයේදී සිඳීයන සමහර ගංගා නිත්‍ය ගංගා ලෙස හැඳින්වේ. (..........)

09 තැනිතලා ප්‍රදේශයක තැනින් තැන පිහිටි උස්තැන් සිතියමේ ස්ථානීය උස අනුව හඳුනාගත හැකිය. (..........)

10 පරිපාලන මායිම් තීරණය කිරීමේදී ගංගා කඳුවැටි යන භෞතික ලක්ෂණ පදනම් කරගෙන ඇත. (..........)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 වර්ග කිලෝමීටර් 10327 ක ප්‍රදේශයක් පෝෂණය කරමින් 335km ක් දුර ගෙවා මුහුදට ගලා බසින ගංගාව මින් කුමක් ද?

(1) මහවැලි (2) කැලණි (3) කලාඔය (4) මල්වතුඔය

12 භූගත ජලය හා රතුපස ප්‍රයෝජනයට ගනිමින් කෘෂිකාර්මික කටයුතුවල සුවිශේෂී දියුණුවක් ලබා ඇති ප්‍රදේශයකි,

(1) කඳුකර කලාපය (2) තෙත් කලාපය (3) උතුරු ප්‍රදේශය (4) වියළි කලාපය

13 2012 සාක්ෂරතා දර්ශකය අනුව සාක්ෂරතා අනුපාතය අඩුම දිස්ත්‍රික්කය වන්නේ,

(1) නුවරඑළිය (2) මඩකලපුව (3) බදුල්ල (4) අම්පාර

14 ලෝකයේ වැඩිම ජන සංඛ්‍යාවක් වෙසෙන ආසියාතික රටවල් දෙක අඩංගු පිළිතුර වන්නේ,

(1) ඉන්දියාව හා පාකිස්ථානය (2) චීනය හා ඇමෙරිකාව

(3) ඉන්දියාව හා බංග්ලාදේශය (4) චීනය හා ඉන්දියාව

15 ලෝකයේ වඩාත්ම උසින් පිහිටීමත් විශාල බිම් ප්‍රදේශයක පැතිරීමත් නිසා ලෝකයේ පියස්ස යන අන්වර්ථ නාමයෙන් හැඳින්වෙන්නේ,

(1) පාමීර් සානුව (2) ටිබෙට් සානුව (3) ඩෙකෑන් සානුව (4) ඉරාන සානුව

- **පහත 'අ' තීරුවේ දැක්වෙන තොරතුරුවලට අදාළ දේශගුණික කලාපය 'ආ' තීරුවෙන් තෝරා ඊට හිමි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉරමත ලියන්න.**

| 'අ' තීරුවේ | | 'ආ' තීරුවේ |
|---|---|---|
| 16 ශ්‍රී ලංකාවේ නිරිතදිග තැනිතලා ප්‍රදේශය මෙයට අයත්ය. | (.........) | A අර්ධ ශුෂ්ක කලාපය |
| 17 ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර තැනිතලා ප්‍රදේශ මෙයට අයත් වේ. | (.........) | B කඳුකර වියළි කලාපය |
| 18 මධ්‍යම කඳුකරයේ බටහිර අර්ධය මෙයට අයත් වේ. | (.........) | C පහතරට තෙත් කලාපය |
| 19 වයඹදිග පිහිටි මන්නාරම හා ගිණිකොනදිග පිහිටි හම්බන්තොට ආදි ප්‍රදේශ මෙයට අයත් වේ. | (.........) | D පහතරට වියළි කලාපය |
| 20 මධ්‍යම කඳුකරයේ නැගෙනහිර අර්ධය මෙයට අයත් වේ. | (.........) | E කඳුකර තෙත් කලාපය |


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



සැලකිය යුතුයි

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (අ) පහත සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A අක්ෂරයෙන් දැක්වෙන ගඟ නම් කරන්න. (ල.01)

(ii) මන්නාරම් දූපත දැක්වෙන අක්ෂරය නම් කරන්න. (ල.01)

(iii) දෙවුන්දර තුඩුව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල.01)

(iv) E අක්ෂරය සඳහන් බොක්ක කුමක් ද? (ල.01)

(v) මඩකලපුව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල.01)

(ආ) භූ ලක්ෂණ සිතියම්වල පහත සඳහන් සම්මත සංකේත රතු වර්ණයෙන් දැක්වෙයි. නිවැරදි වචනය වරහනින් තෝරා හිස්තැනමත ලියන්න. (ල.03)


(හෝටලය / පාසල / රෝහල / පොලීසිය / තැපැල් කාර්යාලය / උප තැපැල් කාර්යාලය / හින්දු සිද්ධස්ථානය)


(i)  ..........................................

(ii)  ..........................................

(iii)  ..........................................

(ඉ) පහත සඳහන් භූ ලක්ෂණ හොඳින් අධ්‍යයනය කර ඒවාට අදාළ නිවැරදි වචනය වරහන් තුළින් තෝරන්න. (ල.04)




(i) A - B රේඛාව මගින් දැක්වෙන්නේ (තැනිතලාවයි / සානුවයි)

(ii) ඊට උදාහරණයක් ලියන්න.

(iii) B අක්ෂරයෙන් දැක්වෙන ස්ථානය (කපොල්ල / රැලිබිම)

(iv) මෙය පිහිටි ස්ථානයක් නම් කරන්න.

(ඊ) පහත රූප ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B




(i) A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) එය කුමන රටකට අයත්වේ ද? (ල.02)

(iii) B රූපයෙන් දැක්වෙන පුද්ගලයා කුමන මානව වර්ගයට අයත් වේද?

(iv) එම මානව වර්ගය ජීවත්වන රටක් ලියන්න. (ල.02)

02 පහත දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න. (ල.11)




<u>හරහට</u>

1. මෙය ආරක්‍ෂා කිරීම මොන්ට්‍රියල් සම්මුතියේ ප්‍රධාන අරමුණකි.
4. ලංකාවේ අඩු ජනව්‍යාප්තිය දැක්වෙන දිස්ත්‍රික්කයකි.
7. සිතියමක මූලික අංගයකි.
8. වී වගාවේ එක් කන්නයකි.
9. ඌව පළාතට අයත් අඩු සංවර්ධනය සහිත දිස්ත්‍රික්කයකි.
11. හොවැංහෝ ගංගාව පැසිපික් සාගරයට එක්වන්නේ මෙම මුහුද හරහාය.

<u>පහළට</u>

2. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර ව්‍යාප්ත ප්‍රදේශයකි.
3. ජපානයේ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම ඇති නිෂ්පාදනයකි.
5. පරිසර සමතුලිතතාව බිඳ වැටීමේ අහිතකර ප්‍රතිඵලයකි.
6. පහතරට වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර සහිත ගිණිකොණදිග ප්‍රදේශයේ පිහිටි වනෝද්‍යානයකි.
10. ශ්‍රී ලංකාවේ අධික ජන ඝනත්වය සහිත බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්කයකි.

(ල. 11)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03 (i) ආසියානු ප්‍රදේශයේ ජලවහණය සම්බන්ධ පහත වගුවේ හිස්තැනට අදාළ පිළිතුර වරහනින් තෝරා ලියන්න. (ල.06)

| ගංගාවේ නම | ගලා බසින ස්ථානය |
|---|---|
| ඕබි, යෙනිසි සහ ලීනා | 1. ........................................................ |
| අමුර්, හොවැංහෝ සහ යැංසි | 2. ........................................................ |
| ගංගානම්, බ්‍රහ්මපුත්‍ර සහ ඉරවඩි | 3. ........................................................ |
| යුප්‍රටීස් හා ටයිග්‍රීස් | 4. ........................................................ |
| සර්ඩේරියා හා අමුඩේරියා | 5. ........................................................ |
| යූරල් ගඟ | 6. ........................................................ |

(ඉන්දියන් සාගරය / පැසිපික් සාගරය / පර්සියන් බොක්ක / ආක්ටික් සාගරය / කළු මුහුද / කැස්පියන් මුහුද / ඒරල් මුහුද)

(ii) ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ. එක් එක් ප්‍රකාශයේ හිස්තැනට අදාළ පිළිතුර වරහනින් තෝරා ඉදිරියෙන් ලියන්න. (ල.05)

1. උතුරු ප්‍රදේශයේ දී 32km පමණ පළල්ව ද දකුණු ප්‍රදේශයේ දී ඇතැම් ස්ථානවලදී 3km දක්වා පටුවේ.
2. වෙරළාශ්‍රිත ප්‍රතිරෝධක පාෂාණ වලින් සමන්විත ප්‍රපාතාකාර බෑවුම් සහිත ප්‍රදේශ -
3. මුහුද දෙසට නෙරාගිය ප්‍රතිරෝධක පාෂාණ සහිත ගොඩබිම් ප්‍රදේශ -
4. මුතුරාජවෙල, බූන්දල සහ ආනවිලුන්දාව ආදී ප්‍රදේශ වල පිහිටයි
5. මහවැලි, මී ඔය සහ කලාඔය වැනි ගංගා මෝය ආශ්‍රිතව බහුලව දක්නට ඇත.

(වෙරළබඩ තැනිතලාව / වෙරළදඹ / ඩෙල්ටා / වගුරු බිම් / අභ්‍යන්තර තැනිතලාව / කලපු / තුඩුව / මොහොර)

04 පෘථිවියේ ප්‍රධාන දේශගුණික කලාප 03 ඇසුරින් පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න. (ල.11)

| | දේශගුණික කලාපය | අක්ෂාංශ ව්‍යාප්තිය 1 | වනාන්තර වල විශේෂ ලක්ෂණ 2 |
|---|---|---|---|
| (i) | නිවර්තන කලාපය (උණුසුම් දේශගුණය) | 1. ........................................ | 6. ................................................ |
| (ii) | නිවර්තන වර්ෂා වනාන්තර | 2. ........................................ | 7. ................................................ |
| (i) | සෞම්‍ය කලාපය (සෞම්‍ය දේශගුණය) | 3. ........................................ | 8. ................................................ |
| (ii) | පතනශීලී වනාන්තර | 4. ........................................ | 9. ................................................ |
| (i) | ශීත කලාපය (ශීත දේශගුණය) | 5. ........................................ | 10. .............................................. |
| (ii) | කේතුධර වනාන්තර | | 11. .............................................. |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05 (i) සංවර්ධනය පිළිබඳ යුනෙස්කෝ ප්‍රකාශයට අනුව සාමාජීය සංවර්ධනය සිදුවිය යුතු ක්ෂේත්‍ර 02 ක් නම් කරන්න. (ල.02)

(ii) ලෝකයේ රටවල් අතර සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා නිර්නායක 04 ක් නම් කරන්න. (ල.04)

(iii) ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්වීම් 02 ක් නිර්නායක ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

06 (i) පාරිසරික සමතුලිතතාව ආරක්ෂා කිරීමට පිහිට වූ සම්මුතීන් දෙකක් පහතින් දැක්වේ. ඒවා පිහිටුවීමේ අරමුණු දෙක ලියන්න. (ල.02)

A - රැම්සාර් සම්මුතිය B - මොන්ට්‍රියල් සම්මුතිය

(ii) පාරිසරික අසංතුලනයට බලපාන හේතු 04 ක් ලියන්න. (ල.04)

(iii) පාරිසරික තුලිතතාව බිඳවැටීමෙන් ඇතිවන අහිතකර බලපෑම් අවම කරගැනීමට ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ල.05)

07 (i) 1 : 50000 භූ ලක්ෂණ සිතියමක තෝරාගත් භෞතික ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ. ඉන් වෙරළබඩ ප්‍රදේශවලට පමණක් සීමාවූ භූ ලක්ෂණ 03 ක් නම් කරන්න. (ල.03)

1. තැනිතලාව
2. උස්බිම
3. තුඩුව
4. ගංගා නිම්නය
5. දූපත
6. බොක්ක
7. ඩෙල්ටාව
8. වෙරළ දඹ
9. කපොල්ල

(ii) 1 : 50000 මෙට්‍රික් සිතියමක සම්මත රතු වර්ණයෙන් දැක්වෙන මායිම් සළකුණු කිහිපයක් පහතින් දැක්වේ. ඒවා හඳුනාගෙන අදාළ පිළිතුර ලියන්න. (ල.04)

A - + — — + — — +

B - + • + • + • +

C - —•••—•••—•••—

D - —••—••—••—

(iii) භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති සම්බන්ධතාව කරුණු 02 ක් ඇසුරින් පහදන්න. (ල.04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) රතු මුහුද (02) රක්වාන (03) ඉන්දියාව (04) ජපානය (05) සංවහන (06) ✓
(07) × (08) × (09) ✓ (10) ✓ (11) මහවැලි (12) උතුරු ප්‍රදේශය
(13) මඩකලපුව (14) චීනය, ඉන්දියාව (15) ටිබෙට් සානුව (16) C (17) D (18) E
(19) A (20) B (2 x 20 = 40)

## II කොටස

01 (අ) (i) කැළණි ගඟ (ල.02) (ii) C (ල.02) (iii) D (ල.01) (iv) කොඩ්ඩියාර් (ල.01)
(v) H (ල.01)
(ආ) (i) පාසල (ii) තැපැල් කාර්යාලය (iii) රෝහල (ල.03)
(ඉ) (i) සානුව
(ii) මහනුවර සානුව / හැටන් සානුව / වැලිමඩ සානුව / මහවලතැන්න සානුව / කොස්ලන්ද සානුව
(iii) කපොල්ල (iv) හපුතලේ / බලන / ගලගෙදර / ගිනිගත්හේන (ල.04)
(ඊ) (i) හොවැංහෝ ගඟ (කහ ගඟ) (ii) චීනය (ල.02)
(iii) මොංගොලොයිඩ් (iv) චීනය / ජපානය / මලයාසියාව / කොරියාව / සිංගප්පූරුව (ල.02)

02 <u>හරහට</u>
1. ඕසෝන් 4. වව්නියාව 7. පරිමාණය 8. යල
9. මොණරාගල 11. කහ මුහුද
<u>පහළට</u>
2. සෝමාවතී 3. පරිගණකය 5. නියගය 6. යාල 10. ගම්පහ (ල.11)

03 (i) 1. ආක්ටික් සාගරය 2. පැසිපික් සාගරය 3. ඉන්දියන් සාගරය
4. පර්සියන් බොක්ක 5. ඊරල් මුහුද 6. කැස්පියන් මුහුද
(ii) 1. වෙරළබඩ තැනිතලාව 2. වෙරළදඹ 3. තුඩුව
4. වගුරුබිම් 5. ඩෙල්ටා (ල.05)

04 1. සමකය - උ.අ. $23.5^0$ 2. සමකය - ද.අ. $23.5^0$
3. උ.අ. $23.5^0$ - උ.අ. $66.5^0$ 4. ද.අ. $23.5^0$ - ද.අ. $66.5^0$
5. උ.අ. $66.5^0$ - උත්තර ධ්‍රැවය
6.7. ස්ථර කිහිපයකින් යුක්ත වේ / වැල් වර්ග, පෙද හා පාසිවර්ග මෙන්ම අපිශාක වර්ග බහුලයි / ජෛව විවිධත්වය ඉහලයි.
8.9. පතනශීලී වනාන්තර වේ / වාර්ෂිකව පත්‍ර හැලීම සිදුවේ
10. 11. කේතුධර වනාන්තර පිහිටයි / හිම පතනයට ඔරොත්තු දීම සඳහා කේතු රූපාකාර හැඩයෙන් යුක්තයි (පි.අ. 11 සහ 12 තොරතුරු අනුව නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.) (ල.11)

05 (i) ආහාර / පෝෂණය / සෞඛ්‍යය / අධ්‍යාපනය / නිවාස / සමාජ සුරක්ෂිතාවය / ඇඳුම් පැළඳුම් / විවේකය හා මානුෂික නිදහස (ල.02)
(ii) ඒක ශීර්ෂ ආදායම / ළදරු මරණ අනුපාතය / උපතේදී ආයු අපේක්ෂාව / සාක්ෂරතාව (ල.04)
(iii) දිස්ත්‍රික්ක අනුව, මාසික කුටුම්භ ආදායම වෙනස / ළදරු මරණ අනුපාත වෙනස / උපතේදී ආයු අපේක්ෂා වෙනස / සාක්ෂරතා වෙනස යනාදී කරුණු 02 ක් පැහැදිලි කිරීමට ලකුණු ලබා දෙන්න. (පි.අ. 70, 71, 72, 73 බලන්න) (ල.05)

06 (i) A - තෙත් බිම් සංරක්ෂණය B - ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීම (ල.02)
(ii) පි.අ. 77 තොරතුරු අනුව ලකුණු ලබාදෙන්න. (ල.04)
(iii) පි.අ. 81 තොරතුරු අනුව ලකුණු ලබාදෙන්න. (ල.05)

07 (i) 1. තුඩුව / ද්වීපත / බොක්ක / ඩෙල්ටාව / වෙරළ දඹ (ල.03)
(ii) A - පළාත් මායිම B - දිස්ත්‍රික්ක මායිම
C - ප්‍රා.ලේ. කොට්ඨාස මායිම D - ග්‍රා.සේ.නි. කොට්ඨාස මායිම (ල.04)
(iii) භූ විෂමතාව හා ජලවහණය අනුව ජනාවාස, භූමි පරිභෝගය, වාරිමාර්ග පද්ධති හා මාර්ග රටා වෙනස්වීම / පරිපාලන මායිම් සඳහා භෞතික ලක්ෂණ උපයෝගී කර ගැනීම - යනාදී කරුණු සඳහා ලකුණු ලබාදෙන්න. (පි.අ. 89 හා 90 බලන්න.) (ල.04)